**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව.**

**මහනුවර දිස්ත්‍රික්කය.**

**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2015 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 23 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 24 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය.**

**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**---------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) බාහිර ආයතනවලින් සංවර්ධන කටයුතු සඳහා ලැබුණු ප්‍රතිපාදනවලින් පරිපාලන වියදම් සඳහා වෙන් කර තිබූ, රු.105,517 ක් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ආ) ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් කුණ්ඩසාල විවිධ සේවා සමූපකාර සමිතියේ තැන්පත් කර තිබූ රු.100,000 ක ආරක්ෂිත තැන්පතු මුදල් ගිණුම්වලින් අත් හැරී තිබුණි.

(ඇ) කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව හා පාතදුම්බර ප්‍රාදේශීය සභාව ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන ජපන් තාක්ෂණික කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ජපන් රජයෙන් පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු භාණ්ඩ නිදහස් කිරීම සඳහා රේගු බදු ලෙස ශ්‍රී ලංකා රේගුවට 2016 ජූනි 30 දිනට පෙර රු.5,798,287 ක බදු මුදලක් ගෙවියයුතු බව දක්වා තිබුණි. එම බදු මුදල් ගෙවන තෙක් ඒ වෙනුවෙන් බැංකු ආරක්ෂණයක් ලෙස ලංකා බැංකුවේ තැන්පත් කළ රු.7,500,000 ක් ස්ථාවර තැන්පතු යටතේ ගිණුම්ගත කර තිබූ අතර, රේගුවට ගෙවියයුතු බදු මුදල් රු.5,798,287 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි 50 ක්, සුසාන භූමි 45 ක් හා ක්‍රීඩා පිටි 04 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

**-----------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ත්‍රීරෝද රථ ගාස්තුව රු.624,924 ක් වුව ද, උපලේඛනයෙහි රු.1,915,475 ක් ලෙස දැක්වීම හේතුවෙන්, රු.1,290,551 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්.**

**-------------------------**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමෙහි රු.15,382 ක බැර ශේෂයක් පැවතුණු අතර, ඒ පිළිබඳ සොයා බලා, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.34 ලැබිය යුතු ගිණුම්**

**-------------------**

ලැබිය යුතු ගිණුම් ශේෂ 05ක එකතු වටිනාකම රු.59,720,965 ක් වු අතර, එයින් අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.36,063,027 ක් වී තිබුණි.

**1.3.5 ගෙවිය යුතු ගිණුම්**

**--------------------**

ගෙවියයුතු ගිණුම් ශේෂ 02 ක එකතු වටිනාකම රු.50,810,492 ක් වූ අතර, එයින් අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.10,232,251 ක් විය.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**------------------------------------**

ගිණුම් විෂයයන් 12 කට අදාළව ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම නිසා, රු.1,065,805,365ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.7 බැංකු ගිණුම්.**

**---------------**

මැණික්හින්න මහජන බැංකුවේ අංක 157100190000052 දරන ජංගම ගිණුමේ 2015 දෙසැම්බර් මස බැංකු සැසඳුම පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) හඳුනා නොගත් ලැබීම් රු.872,031 ක් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම නිසා, සභාවේ ආදායම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ii) 2010 වර්ෂයේ සිට රු.76,560 ක් වූ අගරු වූ චෙක්පත් 04 ක වටිනාකම අය කර ගැනීමට කටයුතු නොකර, දිගින් දිගටම බැංකු සැසඳුමේ මුදල් පොතේ ශේෂයට එකතු කර දක්වා තිබුණි.

(iii) ස්ථාවර තැන්පත් පොළී රු.24,000 ක් සභාවේ ආදායමට නොගෙන බැංකු සැසඳුමේ මුදල් පොතේ ශේෂයට එකතු කර දක්වා තිබුණි.

(iv) වසර 05 කට පෙර සිට තැන්පත් කර උපලබ්ධි නොවූ රු.274,730 ක් වූ අයිතම 36 ක් පිළිබඳව සොයා බලා ආදායමට ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම බැංකු සැසඳුමේ දක්වා තිබුණි.

(v) 2012 වර්ෂයේ බැංකු සැසඳුම්වලට අනුව, 2008 වර්ෂයේ සිට පවතින උපලබ්ධි නොවූ තැන්පතු අවස්ථා 08 ක වටිනාකම වූ රු.25,059 ක් හා හඳුනා ගත නොහැකි ලැබීම් රු.48,027 ක් බැංකු

සැසඳුම්වලින් ඉවත් කර තිබී, නැවත 2016 ජනවාරි මස බැංකු සැසඳුම්වලට ඇතුළත් කර බැංකු සැසඳුම් පිළියෙළ කර තිබුණි.

(vi) අවස්ථා 87 කට අදාළ හඳුනා නොගත් ගෙවීම් රු.622,564 ක් හඳුනා ගැනීමට කටයුතු කිරීමකින් තොරව බැංකු සැසඳුම්වල දිගින් දිගටම දක්වා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.94,887,182 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.81,885,063 ක් වුයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලවල රු.13,002,119 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015.01.01 ට හිඟය | වර්ෂයේ බිල් කළ ආදායම | එකතු කළ ආදායම<br>2015 .01.01 දිනට හිඟයෙන් එකතු කළ ආදායම | එකතු කළ ආදායම<br>2015 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම | ජර්නල් සටහන් මගින් ගැලපීම | මුළු අය කලයුතු ප්‍රමාණය 2015.12.31 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 6,158,237 | 7,492,024 | 2,728,799 | 4,459,997 | (525,694) | 5,935,771 |
| අක්කර බදු | 81,671 | 7,685 | 23,345 | 3,641 | (22,590) | 39,780 |
| කඩකුලී | 352,773 | 4,688,895 | 352,773 | 4,227,180 | 2,568,169 | 3,029,884 |
| ත%Sවිල් ගාස්තු | 790,865 | - | 165,940 | - | - | 624,925 |
| කසල ගාස්තු | 626,644 | 2,213,300 | 496,740 | 983,460 | - | 1,359,744 |
| උසාවි දඩ | 610,580 | 653,000 | 226,204 | - | - | 1,037,376 |
| මුද්දර බදු | 27,131,620 | 44,092,265 | 49,917,735 | 213,300 | - | 43,878,965 |
| එකතුව | | | | | | 55,906,445 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායම් විෂයන් 07 ක රු. 55,906,445 ක ආදායමක් හිග හිට තිබුණි.

**2.2.2 වරිපනම් බදු.**

--------------

පහත කරුණු නිරීක්ෂණය කරුන ලැබේ

(අ) වරිපනම් බදු වසර 05 කට වරක් තක්සේරු කර, ගාස්තු නියම කළයුතු වුවත්, 2008 වර්ෂයේ තක්සේරු වටිනාකම් පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයට ද වරිපනම් බදු අය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වරිපනම් බදු රු.6,158,237 ක හිග ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.7,492,024 ක් වී තිබුණි. හිගයෙන් රු.2,728,799 ක් හෙවත්, සියයට 44 ක් හා බිල් කිරීම්වලින් රු.4.459,997 ක් හෙවත් සියයට 60 ක් අය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිග වරිපනම් බදු ශේෂය රු.5,935,771 ක් වී තිබුණි. වරිපනම් බදු පැහැර හරින්නන් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) රජයේ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සංස්ථාවලින් වසර 01 සිට 10 දක්වා කාලයක සිට අය නොවී පවතින හිග වරිපනම් බදු රු.932,814 ක් විය.

**2.2.3 බලපත්‍ර ගාස්තු.**

------------------

පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ

(අ) පරිසර බලපත්‍ර වර්ෂ 03 කට වරක් අලුත් කළයුතු වුව ද, ව්‍යාපාර 51 ක බලපත්‍ර අලුත් කර නොතිබූ බැවින්, සභාවට රු.204,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) පරිසර බලපත්‍ර ලබා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයට වෙළද බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර 113 ක් සම්බන්ධයෙන් සභාවට රු.113,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ (ඒ යටතේ පනවන ලද රෙගුලාසීවලට අනුකූලව) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත කර්මාන්ත 38 ක පරිසර බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර පවත්වා ගෙන තිබූ අතර, මේ හේතුවෙන් රු.152,000 ක පරිසර බලපත්‍ර ආදායමක් හා පරීක්ෂණ ගාස්තු සභාවට අහිමි වී තිබුණි.

**2.2.4 වෙනත් ආදායම්.**

-----------------

**(අ) අක්කර බදු.**

----------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිග අක්කර බදු රු.39,780 ක් වූ අතර, එයින් රු.35,736 ක් හෙවත් මුළු හිගයෙන් සියයට 90 ක් වර්ෂයකට වැඩි කාලයක සිට අය නොවී පැවතින.

**(ආ) ත්‍රී රෝද රථ ගාස්තු.**

සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ ලියාපදිංචි වී තිබුණු ත්‍රී රෝද රථ 929 කින් රු.624,925 ක ගාස්තු වර්ෂයකට වැඩි කාලයක සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) කඩ කාමර බදු**

1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව බදු දී තිබූ කඩ කාමර බදුකරුවන් විසින් අතුරු බදු දී තිබූ අතර මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි.

**2.2.5 උසාවි දඩ.**

සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,037,376 ක මුදලක් අය වියයුතුව පැවතුණි.

**2.3 අධිභාර.**

දෛනිකව රැස් කර, බැංකුගත කළයුතු මුදල් බැංකුගත කිරීමකින් තොරව අයථා පරිහරණයට යොදා ගැනීම හේතුවෙන්, රු.136,466 ක මුදලක් අය කිරීම සඳහා මා විසින් අධිභාර සහතික නිකුත් කර තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවට අයත් ඉඩම් කැබලි 20 ක්, සුසාන භූමි 45 ක් හා ක්‍රීඩා පිටි 04 ක අයිතිය තහවුරු කරන ලිය කියවිලි ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතී 218 නියමය අනුව සභාවේ සියලු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්ථාන මාරු වී ගිය, වෙනත් සේවාවන්ට ගිය හා සේවය අත හැර ගිය සේවකයින් 08 දෙනෙකුගෙන් වර්ෂ ගණනාවක සිට අය විය යුතුව තිබූ රු.218,770 ක ණය ශේෂය, අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 නාගරික සංවර්ධන අධිකාරී බැංකු ගිණුම.**

1987 සැප්තැම්බර් 30 දිනැති අංක 05/01/119 දරන නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිගේ ලිපියේ 02 ඡේදය ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරී බැංකු ගිණුමේ මුදල් එම අධිකාරියේ පූර්ව අනුමැතියකින් යුතුව පළාත් පාලන ආයතන මගින් ආරම්භ කිරීමට අපේක්ෂා කරන සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් වැය කළ හැකි බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුමේ වූ රු.2,138,238 ක මුදල උපයෝගී කර ගෙන කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබුණි.

**3.3 හඳුනාගත් අලාභ**

2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව, සභාවේ පුස්තකාල 10 කින් සමීක්ෂණයට ඉදිරිපත් නොකළ පොත් 430 ක් සඳහා වගකිවයුතු නිලධාරීන්ගෙන් අය කර ගැනීමට සඳහන් කර තිබූ රු.61,849 ක් අදාළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 වෙළඳ සංකීර්ණය තුළ කඩ කාමර බදු දීම.**

ප්‍රාදේශීය සභාව විසින් බදු පදනම මත ලබා දීම සඳහා මහජන මුදල්, සභා අරමුදල් හා වෙනත් බාහිර ආයතනවල ප්‍රතිපාදන මත ගොඩනැගිලි සංකීර්ණ 07 ක කඩ කාමර 232 ක් ඉදි කර තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ටෙන්ඩර් පිරිනමා වර්ෂ 10 ක කාලයක් ගත වී ඇතත්, මූලික ටෙන්ඩර් මුදල් සම්පූර්ණයෙන් අය කර ගැනීමකින් තොරව හා විධිමත් ලිඛිත ගිවිසුම්වලට එළඹීමකින් තොරව කඩ කාමරවල ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට ඉඩ හැර තිබුණි. ඒ අනුව, කඩ කාමර 49 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.20,770,410 ක හිඟ ටෙන්ඩර් මුදලක් අය කර ගැනීමට තිබුණි.

(ආ) ටෙන්ඩර් මුදල් නොගෙවූ බදුකරුවන් 47 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.3,968,750 ක බදු කුළී අය කර ගැනීමට තිබුණි.

(ඇ) 2016 මැයි 06 දින වන විට කඩ කාමර 59ක් වසා දමා තිබූ අතර, සමහර කඩ කාමර ඉදි කළ කාලයේ සිට හා වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට වසා දමා තිබුණි. මීට අමතරව ටෙන්ඩර් ප්‍රදානය කර තිබූ නමුත්, ව්‍යාපාර කටයුතු සඳහා විවෘත නොකළ කඩ කාමර සංඛ්‍යාව 57 ක් විය.

(ඈ) බලගොල්ල මොරගස්පිටියවත්ත ගොඩනැගිල්ලේ පළමු මහලේ වම් පස අවසානයේ පැවති අංක 26 දරන කඩ කාමරයට යාබද වැසිකිළි පද්ධතිය සභාවේ අනුමැතියකින් තොරව වෙනස් කර, කඩ කාමර බවට පරිවර්තනය කර තුරඟ තරඟ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බව 2016 මාර්තු 02 දින කරන ලද භෞතික පරීක්ෂණයේ දී නිරීක්ෂණය විය. අනුමැතියකින් තොරව වැසිකිළි පද්ධතිය කඩ කාමර බවට පත් කර ගැනීම සම්බන්ධව සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන විශාල මුදලක් වැය කර එම ගොඩනැගිල්ලට දුරස්ව වෙනම වැසිකිළි පද්ධතියක් සභාව විසින් ඉදි කර තිබුණි.

(ඉ) දිගන බහු කාර්යය ගොඩනැගිල්ලේ ඉහළ මහළට පිවිසීමට හා ව්‍යාපාරික කටයුතු සඳහා සුදුසු වන පරිදි ඉහළ මහලේ කඩ කාමර සැළසුම් කර ඉදි කර නොතිබීම හේතුවෙන් මෙම කඩ කාමර වෙළඳාම සඳහා විවෘත කිරීමට නොහැකි වී තිබුණි. එහි කඩ කාමර කිහිපයක ඉදි කිරීම් අතරමග නවතා දමා තිබූ අතර, ගොඩනැගිල්ලෙන් පිටතට නිරාවරණය වී තිබූ යකඩ කම්බි ස්වාභාවික උපද්‍රවවලට ලක් වී දිරාපත් වෙමින් පැවතුණි.

(ඊ) මැණික්හින්න බස් නැවතුම්පළේ, දිගන බහු කාර්යය ගොඩනැගිල්ලේ හා බලගොල්ල මොරගස්පිටිය වත්ත මහල් ගොඩනැගිල්ලේ කඩ කාමර ව්‍යාපාරික කටයුතුවලට සුදුසු පරිදි නිසි සැළසුමකින් තොරව ඉදි කිරීම හේතුවෙන් එම කඩ කාමරවල ව්‍යාපාර කටයුතු අසාර්ථක වී තිබීම නිසා, වසා දමා තිබුණි.

**3.5 අවිධිමත් ගනුදෙනු.**

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළමු ශ්‍රේණියට උසස් වීමේ නියමිත වැටුප් තලයේ පිහිටුවීමේ දී 2006 අප්‍රේල් 25 දිනැති අංක 6/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව වැටුප් පිළියෙළ කිරීම නිසා, සභාවේ සේවයේ නියුක්තව සිටි පෙර පාසැල් පාලිකාවකට 2006 ජනවාරි සිට 2015 මාර්තු දක්වා කාලයට රු.502,705 ක් වැඩි පුර වැටුප් ගෙවා තිබුණි. මධ්‍යම පළාත් පාලන කොමසාරිස්වරයා 2014 දෙසැම්බර් මාසයේ දී මේ සම්බන්ධව පරීක්ෂා කර වාර්තා කර ඇතත්, එකී වැඩිපුර ගෙවූ වැටුප් අය කර ගැනීමට කටයුතු කිරීමකින් තොරව අදාළ පෙර පාසැල් පාලිකාවට 2015 මාර්තු මාසයේ දී විශ්‍රාම ගැනීමට ඉඩ හැර තිබුණි. මෙයින් රු.173,089 ක් අය කර ගත් බව ලේකම්වරයා විසින් මා වෙත 2016 ජුලි 27 දින වාර්තා කර තිබුණද ඉතිරි මුදල් අය කර ගෙන නොතිබුණි.

(ආ) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් නඩත්තු ඒකකයක ප්‍රයෝජනය සඳහා 2014 දෙසැම්බර් මාසයේ දී සභාව වෙත ලබා දි රු.566,858 ක් වටිනා ගැල්වනයිස් බට 512 කින් රු.419,608 ක් වටිනා බට 379 ක් සභාපතිවරයා වෙත නිකුත් කර තිබූ අතර, එම බට 2016 ජූනි 30 දින වන විටත් සභාවට ආපසු භාර දී නොතිබුණි. ගැල්වනයිස් බට 164 ක් ගබඩාවට භාර දී ඇති බව ලේකම්වරයා විසින් 2016 ජූලි 27 දින මා වෙත වාර්තා කර තිබුණි.

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය.**

---

**3.6.1 බලතොට ඇළ පාළම ඉදි කිරීම.**

---

සභා අරමුදල් යටතේ රු.6,872,724 ක වැඩ ඇස්තමේන්තුවක් අනුව, රු.6,595,962 ක මුදලකට 2015 මැයි 27 දින පුද්ගලික ආයතනයට ඉදි කිරීම් පවරා නැවත රු.9,187,055 ක මුදලකට ඇස්තමේන්තුව සංශෝධනය කර, 2016 මැයි 30 දින වන විට රු.2,181,589 ක කොටස් මුදලක් ගෙවා තිබුණි. 2016 මාර්තු 15 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) අධික වර්ෂාව හේතුවෙන් ගැළවී කඩා වැටී තිබූ පාළම ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා නැවත ඉදි කිරීමට සැළසුම් කර තිබුණි. මේ ආකාරයේ ඉදි කිරීම් සඳහා වෘත්තීය සුදුසුකම් සහිත ඉංජිනේරුවරයෙකු ලවා සැළසුම් හා ඇස්තමේන්තු පිළියෙළ කළයුතු වුවත්, භූමියේ පිහිටීම, පස් සාම්පල් පරීක්ෂා කිරීම යනාදිය පිළිබඳ අධීක්ෂණයකින් තොරව සභාවේ කාර්මික නිලධාරීවරයෙකු ලවා රු.6,872,724 ක වටිනාකමකට ඇස්තමේන්තු සකස් කර තිබුණි.

(ආ) එසේ පිළියෙළ කරන ලද ඇස්තමේන්තුවේ පිළියෙළ කළ, පරීක්ෂා කළ, නිර්දේශ කළ නිලධාරීන්, පිළියෙළ කළ දිනය යනාදී කිසිදු තොරතුරක් සඳහන් කර නොතිබිය දී, සභාපතිවරයා දින රහිතව ඇස්තමේන්තුව අනුමත කර තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරු පාළම ඉදි කිරීමේ කටයුතු ආරම්භ කළත්, භූමියේ තත්ත්වය මඩ සහිතව පැවතීම නිසා, පවරා තිබූ ඇස්තමේන්තුවට අනුව ඉදි කිරීම් කළ නොහැකි බව දැන්වීම හේතුවෙන් පසුව පස් සාම්පල් පරීක්ෂා කර රු.9,187,055 ක මුදලකට ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි. මෙය මුල් ඇස්තමේන්තුවට වඩා සියයට 39 ක වැඩි වීමක් වූ අතර, මුල් කොන්ත්‍රාත්කරුටම ඉදි කිරීම් කටයුතු පවරා තිබුණි.

(ඇ) මෙම ඉදි කිරීම සම්බන්ධව කාළගුණ වාර්තා හා ඉලක්කගත වැඩසටහන් නඩත්තු කර නොතිබුණි.

**3.6.2 මැණික්හින්න නගරයේ නව කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම.**

---

සභා අරමුදල් යටතේ රු.31,630,912 ක වැඩ ඇස්තමේන්තුවක් අනුව රු.24,918,599 ක මුදලකට පුද්ගලික කොන්ත්‍රාත්කාර ආයතනයට 2015 මැයි 29 දින ඉදි කිරීම් පවරා 2016 මාර්තු 31 දින වන විට රු.3,512,186 ක කොටස් මුදල් ගෙවා තිබුණි. ඉදිකරිම සම්බන්ධයෙන් 2016 මාර්තු 15 දින කරන ලද භෞතික පරීක්ෂාවේ දි, පහත කරුණු අනාවරණය විය.

(අ) ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා “ලංවා” වර්ගයේ දගර වානේ කම්බි යොදා ගැනීමට ඇස්තමේන්තු කර ඇතත්, ගොඩනැගිල්ලට ආසන්නව ඇති ආරක්ෂිත බැම්ම, කුළුණු හා කොන්ක්‍රීට් තලාද සඳහා “අශෝක්” වර්ගයේ දගර කම්බි යොදා ගෙන ඉදි කිරීම් කර තිබුණි. දගර කම්බිවල වෙළඳ නාමය වෙනස් කිරීම පිළිබඳ ඉංජිනේරු අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

(ආ) ගොඩනැගිල්ලේ බිත්ති බැදීම සඳහා යොදා ගෙන තිබූ ඉංජිනේරු ගඩොල් ඉදි කිරීම් සඳහා යොදා ගැනීමට නුසුදුසු ප්‍රමිතියෙන් අඩු ඒවා බව කාර්මික නිලධාරී වාර්තා කර තිබුණි.

(ඇ) මෙම ගොඩනැගිල්ල ඉදි කිරීමේ ඇස්තමේන්තු, නිර්මාණ හා සැළසුම් කටයුතු මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයෙකු වෙතින් ඉටු කරවා ගෙන රු.316,482 ක් ගෙවා තිබූ නමුත්, එම නිලධාරීයාගෙන් රාජ්‍ය භාගය අය කර, රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය.**

---

**4.1 අයවැය පාලනය.**

---

වැය විෂයයන් 09 ක් සඳහා අය වැයගත රු.1,450,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු මුදලක් වැය කර නොතිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.**

---

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය.**

---

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

---

වටිනාකම හදුනාගත නොහැකි වාහන 02 ක් හා රු.745,000 ක් වටිනා වාහන 02 ක් වසර 03 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතිණි.

**5.** **පද්ධති හා පාලනය.**

**-----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය
(ආ) ණයගැති/ණයහිමි පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) තොග පාලනය
(ඉ) කොන්ත්‍රාත් පාලනය